**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.**

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිස ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

2010 දෙසැම්බර් 31 දිනට අවලංගු කළ වටිනාකම රු. 469,815 ක් වූ චෙක්පත් 130 ක් සම්බන්ධයෙන් නව චෙක්පත් නිකුත් කර නොතිබුණු අතර ණයහිමියන් ප්‍රතිෂ්ඨාපනය නොකොට විවිධ ණය හිමියන් යටතේ අවලංගු කළ චෙක්පත් ලෙස ගිණුම් ගත කර තිබුණි. මින් 28% ක් හෙවත් රු. 132,811 ක් වර්ෂ 2006 - 2009 දක්වා වූ කාලසීමාවට අයත් විය.

1.2.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ලැබිය යුතු ගිණුම්**

------------------

(i) සංස්ථාවේ සේවාදායක ණයගැති ශේෂය රු.596,893,398 ක් වූ අතර ණය දීමේ ප්‍රතිපත්තිය අනුව ණය කාල සීමාව එක් මාසයකට සීමා වුවත් ණයගැතියන්ගෙන් මාසයකට වැඩි ණයගැති ප්‍රමාණය 73 % ක් හෙවත් රු.438,302,752 ක් ද මාස තුනකට වැඩි ණයගැති ප්‍රමාණය 32% ක් හෙවත් 188,422,097 ක් විය. වසර තුනට වැඩි සේවාදායක ණයගැති ශේෂය රු.114,102,031ක් හෙවත් 19% ක් විය.

(ii) 2010 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවාදායක ණයගැති ශේෂයෙන් 2.4 % ක් හෙවත් රු.14,079,658 ක් වු ණය, රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අතර එය වර්ෂ 1සිට 11 දක්වා වු කාල සීමාවකට අයත් විය. මෙයින් වසර 5 ඉක්මවු ණය ප්‍රමාණය රු.6,777,583 ක් විය.

(iii) සේවාදායකයකුගේ නමක් සඳහන් නොවන ගිවිසුම් 7 කට අදාල ණයගැති ශේෂ වටිනාකම රු.22,171,350 ක් හෙවත් මුළු ණයගැති ශේෂයෙන් 4% ක් විය.

(iv) 2010 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවාදායක ණයගැති ශේෂයන් තුල 2003 වර්ෂයේ සිට 2007 වර්ෂයන්ට අදාලව ආයතන 4 කින් රු. 17,724,931 ක් අයවිය යුතු අතර එය මුළු ණයගැති ශේෂයෙන් 3% ක් විය.

(v) සාමාන්‍ය සේවාදායක ගිවිසුමකට අදාල ප්‍රචාරණ දැන්වීම් පළකිරීමට පෙර ණය ගෙවීමේ විශ්වාසදායී බව තහවුරු කර ගැනීමට ණය ආවරණ අංශයේ තහවුරුව ලබා ගැනීමේ අභ්‍යන්තර පාලන ක්‍රමයක් පැවතියද මුදල් නොගෙවු ආයතන වෙත නැවත නැවත සේවාව සපයා පසුගිය 2007, 2008, 2009 වර්ෂ වලට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත නොහැකි ණය ප්‍රමාණය රු. 49,228,657 ක් විය.

(vi) 2010 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ රු. 55,480,000 ක් වු විවිධ ණයගැතියන්ගෙන් අඩමාන ණය සඳහා වෙන්කිරීම රු. 21,717,482 ක් හෙවත් 39 % ක් විය. එම ශේෂය තුළ වර්ෂ 2 ක් හා ඊට වැඩි කාලයක සිට පැවත එන පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු. 219,215 ක් ද, විදේශීය රූපවාහිනී ආයතනයන්ගෙන් අයවිය යුතු රු. 6,482,135 ක්ද, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.17,858,971 ක් සහ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේදී රක්ෂණ සමාගම් වෙතින් අයවිය යුතු රු. 1,111,780 ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

(vii) ආපදා ණය, ප්‍රවාහන ණය හා විශේෂ ණය ලබාගත් සේවකයන් විශ්‍රාම ගැනීමේදී හෝ ඉල්ලා අස්වීමේදී හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු. 154,079 ක් අඩමාන ණය ලෙස වෙන් කිරීමට සිදුවී තිබුණි.

(viii) **අත්තිකාරම් දීම හා පියවීම**

----------------------------

පරිගණක වැඩසටහන් හා සම්බන්ධ කාර්යයන් 2 ක් සඳහා 2008 වර්ෂයේ කොන්ත්‍රාත්කරුවන්ට රු. 858,000 ක් ලබා දී තිබු නමුත් එකී කාර්යයන් ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටත් සම්පුර්ණ කරගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වසර 5 ක් ඉක්මවූ ගෙවිය යුතු ණය රු. 12,468,340 ක් වූ අතර මින් රු. 83,572 ක් වූ ණය වසර 10 ක් ඉක්මවා තිබුණි.

(ii) ගිවිස ගත් කාර්යය නිමවීමෙන් මාස 06 කට පසව ඉදිකිරීම් වෙනුවෙන් ව රැඳවුම් මුදල් අදාල කාර්යය නිසි ලෙස ඉටු කරවා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමෙන් පසුව නියමිත කොන්ත්‍රාත් කරුවන් වෙත ආපසු ගෙවිය යුතු වුවත් 2006 සිට 2009 වර්ෂයේ අගෝස්තු දක්වා වූ කාලයට අදාල වූ රු. 265,481 ක නොගෙවන ලද රදවා ගත් මුදල් ශේෂයක් විය.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

------------------------------------

අවස්ථා 04 කට අයත් එකතු වටිනාකම රු. 3,441,755 ක් වූ සේවාදායක මාරුකිරීම්, ආරක්ෂක ඇප,ගෙවිය යුතු වැටුප් හා වේතන, කෙරගෙන යන වැඩ ශේෂයන් පිළිබඳ උපලේඛන හා කාල විශ්ලේෂණද සංස්ථාවේ රු. 40,024,000 ක්වූ ඉඩම් හා සම්ප්‍රේෂණාගාර පිහිටි ඉඩම් සම්බන්ධ හිමිකම් ඔප්පු , පැවරුම් පත්‍ර , ගැසට් නිවේදනද විගණනය සඳහා ඉදිරිපත් නොවුයෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

----------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තියේ (ආ) හා 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2010 වර්ෂය තුළ ලංකා බැංකුවේ ආයෝජනය කළ රු.22,000,000 ක් වූ ස්ථාවර තැන්පත් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 1988 අංක 24 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම් පනත | සංස්ථාවේ මාණ්ඩලික හා විධායක ශ්‍රේණි වල නිලධාරීන් වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවත් අදාල නිලධාරීන් 91 දෙනෙකුගෙන් වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබුනේ 34 ක් පමණි. |

(ඇ) **2003 ජුනි 02 දින හා අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

-----------------------------------------

| | |
|---|---|
| (i) 5.1.3 වගන්තිය | යාවත් කාලීන කළ 2010 වර්ෂය සඳහා වූ සංයුක්ත සැලැස්ම වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2011 අප්‍රේල් 30 දින වන විටත් යාවත්කාලීන කල සංයුක්ත සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ii) 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කළ යුතු 2010 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2011 මැයි 02 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2005 ජුලි 01 දින හා අංක පීඊඩී/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2010 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. |

(ඉ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

-----------------------------------------

| | |
|---|---|
| මු .රෙ.880 | ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප ලබා ගෙන නොතිබුණු අතර සංස්ථාවේ මුදල් අයකැමියන් ගෙන් පමණක් ඇප ලබාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 42,120,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වු අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ලාභය රු.12,360,000 ක් වූයෙන් බදු පූර්ව ලාභයෙහි රු. 29,760,000 ක වර්ධනයක් දක්නට ලැබුණි.

#### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------

වර්ෂයේ ලාභය වැඩිවීම කෙරෙහි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 හි ප්‍රාග්ධන ප්‍රවේශය අනුගමනය කිරීම නිසා ආදායමට එකතු වු රු.13,596,000 ක්ද 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි Defind Benefit Plan අනුගමනය කිරීම නිසා ගිණුම් ගැලපීමෙන් ජනිත වු රු. 48,065,000 ක අතිරික්තය ගැලපීම ද බලපා ඇත .ඉහත බලපෑම් ඉවත් කල විට සංස්ථාව මෙහෙයම් අලාභයක් ලබා තිබු අතර එය රු. 19,541,000 ක් විය.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

#### 2.2.1 සංස්ථාවට එරෙහිව/එදිරිව ගොනු කරන ලද නඩු

--------------------------------------------------

2010 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 08 ක් පවරා තිබු අතර සංස්ථා කාර්ය මණ්ඩලය විසින් නඩු 11 ක් ද වශයෙන් නඩු 19 ක් පවරා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එයින් නඩු 06 ක් අවසන් වී තිබුණි. මෙම නඩු සඳහා නිතීඥ ගාස්තු වශයෙන් බාහිර නිතිඥයින්ට සමාලෝචිත වර්ෂයේදී රු. 3,268,844 ක මුදලක් ගෙවා තිබුණි. බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 08 අදාලව පැමිණිලි පාර්ශ්වය විසින් ඉල්ලා ඇති වන්දි මුදල රු. 1,072,500,000 ක් විය. එසේම රූපවාහිනී සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 18 ක් පවරා තිබු අතර එම නඩු වලින් සංස්ථාව අයකර ගැනීමට බලාපොරොත්තු වන මුදල රු. 21,175,516 ක් විය. එයින් නඩු 04 ක් සමාලෝචිත වර්ෂය තුලදී අවසන් වී ඇත අතර රු.1,256,562 ක් සංස්ථාව විසින් අයකර ගෙන තිබුණි. මෙම නඩු සඳහා නිතීඥ ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේදී බාහිර නිතිඥයින්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය රු. 414,000 ක් විය.

#### 2.2.2 ප්‍රති වෙළඳ ගිවිසුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රති වෙළඳ ගිවිසුම් ආදායම රු. 44,969,989 ක් වු අතර වියදම රු.71.932,107 ක් විය.මේ අනුව ප්‍රති වෙළඳ ගිවිසුම් වලින් සංසථාව ලැබු පාඩුව රු. 26,962,118

ක් වු අතර මෙම පාඩුව ප්‍රති වෙළඳ ආදායමට සාපේක්ෂව 60% ක් විය.මෙම පාඩුව 2007 වර්ෂයේදී රු. 33,000,000 ක් වූ අතර, එය එම වසරේ ප්‍රති වෙළඳ ආදායමට සාපේක්ෂව 97% ක් වු අතර 2008 වර්ෂයේදී මෙම පාඩුව රු. 21,453,000 ක් වූයෙන් එය ඉපයූ ආදායමෙන් 221% ක් විය. මේ අනුව සංස්ථාව දිගින් දිගටම ප්‍රති වෙළඳ ගිවිසුම් මගින් විශාල පාඩුවක් ලබන බව නිරීක්ෂණය වු අතර 2009 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රතිවෙළඳ ගිවිසුම් වලින් ලද ආදායම හා වියදම වෙන්ව හඳුනා ගත හැකි පරිදි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ණයගැති ශේෂය තුල ඇතුලත් රු. 7,755,112 ක් වු ප්‍රතිවෙළඳ ගිවිසුම් 08 ක් වෙනවෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර මෙම ආයතන පෙරලා සංස්ථාව වෙත කිසිදු සේවාවක් සපයා නොතිබුණි.

(ඇ) විගණනය සඳහා ලැබුණු තොරතුරු අනුව චිත්‍රපට මිලදී ගැනීම සඳහා එළඹි ප්‍රති වෙළඳ ගිවිසුම් හැර අනෙකුත් සියළුම ප්‍රති වෙළඳ ගිවිසුම්වල පහත වගන්තිය ගිවිසුමේ අන්තර්ගත කර ඇත. "ගිවිසුම්ගත කාලය තුළ අදාල වටිනාකමට සැහෙන සේවාවක් ලබාගෙන නොමැති නම් එම පාඩුව ආයතනය විසින් දරාගත යුතුය." ඒ අනුව ප්‍රති වෙළඳ ගිවිසුම් 12 කින් රු. 8,294,384 ක පාඩුවක් රූපවාහිනී සංස්ථාවට දැරීමට සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය. නමුත් මෙම වටිනාකම සාමාන්‍ය ණයගැතියන් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. අදාල ආයතන ක්‍රියාකාරී නොවන අවස්ථා වලදී පාඩු විඳීමට සිදුවී ඇති බව සභාපති දැනුම් දී ඇත.

(ඇ) 2006 වසරේ සිට 2010 වර්ෂය දක්වා ප්‍රති වෙළඳ ගිවිසම් යටතේ ලබා ගත් චිත්‍රපට 8 ක් සඳහා රු.10,505,900 ක් වටිනා ගුවන් කාලයක් සපයා ඇති අතර, ඉන් උපයා ඇති ආදායම රු. 1,465,975 ක් විය. ඒ අනුව සංස්ථාවට දරා ගැනීමට සිදුවී ඇති පාඩුව රු. 9,039,925 ක් විය.

(ඉ) යම් කාලසීමාවක් ඉකුත් වු පසු එම ප්‍රතිවෙළඳ ගිවිසුම්හි පවතින හර හෝ බැර ශේෂ අවලංගු වන අකාරයේ ගිවිසුම් වලට එළඹ ඇතත්, රු. 361,100 ක් වටිනා ගිණුම් ශේෂයන් අදාල කාලසීමාව ඉකුත්වී තිබියදීත් තවදුරටත් ණය හිමි ශේෂ ලෙස 2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල නිරූපනය විය.

(ඊ) ප්‍රති වෙළඳ ගිවිසුම් යටතේ රු. 1,730,900 ක් වටිනා ගුවන් කාලයක් සපයා 2007 වර්ෂයේ ලබා ගත් චිත්‍රපට 2 ක් පසුව සංස්ථාවේ ප්‍රතිපත්ති වලට පටහැනි වන බව තීරණය කර ප්‍රදර්ශනය කිරීම තහනම් කර තිබුණි. මිලදී ගැනීමේ කමිටුව මෙසේ රූපවාහිනී මාධ්‍යයේ පුදර්ශනය කළ නොහැකි චිත්‍රපට ප්‍රති වෙළඳ ගිවිසුම් මගින් මිලදී ගැනීමට කටයුතු කර තිබීම නිසා සංස්ථාවට අලාභයක් සිදුවී ඇති බවද නිරීක්ෂණය විය.

(උ) රු.750,000 ක් වටිනා ගුවන් කාලයක් සපයා රූපවාහිනියට ලබා ගෙන ඇති චිත්‍රපටයක් 2006 ජූලි 28 සිට 2008 ජූලි 27 අතර කාලය තුළ දර්ශන වාර 3 ක් පෙන්වීම සඳහා ගිවිසුම් සකස් කර රූපවාහිනියට අයිතිය ලබා ගෙන තිබූ නමුත් මෙම චිත්‍රපටය එම කාලය අතරතුර එක් වතාවක්වත් ප්‍රදර්ශනය කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර 2010 වර්ෂයේදීද ප්‍රදර්ශනය කර නොතිබුණි. ප්‍රචාරණයට නුසුදුසු බවට තීරණය කර ඇති බැවින් ප්‍රචාරය කර නොමැති බව සභාපති දැනුම් දී ඇත.

2.2.3 ආයෝජන

-----------

1992 හා 1994 වර්ෂ වලදී ලංකා පුවත් ආයතනයේ රු. 1,104,000 ක දායකත්ව ආයෝජනයක් කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය දක්වා කිසදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණු අතර එම ආයෝජන තවදුරටත් එසේම පවත්වා ගෙන ගොස් තිබුණි .

2.2.4 **ආර්ථික නොවු ගණුදෙණු**

----------------------------

ප්‍රජා රූපවාහිනී මධ්‍යස්ථානයක් පිහිටුවීම වෙනුවෙන් 2009 සැප්තැම්බර් මස සිට වර්ෂයක කාලයක් සඳහා බදු පදනම මත ලබාගත් නිවාසයක් වෙනුවෙන් සංස්ථාව අළුත්වැඩියා හා අනෙකුත් වියදම් වශයෙන් රු. 604,998 කඳ බදු කුලී වශයෙන් රු. 29,585 ක්ද දරා තිබු නමුත් එය කිසිදු කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

2.2.5 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

රූපවාහිනි ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලයේ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා එහි කටයුතු පරිගණක ගත කොට වැඩිදියුණු කිරීම අරමුණු කර රු. 2,055,502 ක් වැයකර 2005 වර්ෂයේ මිලදී ගෙන ඇති ස්වයංක්‍රිය බාර්කෝඩ් පද්ධතියෙහි ( Automated Barcode Solution ) කොටස් කීපයක් හා විද්‍යුත් කැසට් ආරක්ෂණ පද්ධතිය ( EAS System ) 2010 ජුලි මාසය අවසාන වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

3. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපති වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ණයගැති /ණයහිමි පාලනය
(ඇ) ගුවන් කාල ආදායම්
(ඈ) අත්තිකාරම්
(ඉ) අයවැය
(ඊ) චෙක්පත් අවලංගු කිරීම
(උ) ප්‍රති වෙළඳ ගිවිසුම්
(ඌ) බදු නිවාස